# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
# (රක්ෂණ කර්මාන්තයේ නියාමක)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත්, ස්වයං-ප්‍රේරිත සහ කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රියදුරු සහ කාර්යාල සහායක තනතුර -** මෙම තනතුර සඳහා බරවාහන පැදවීම සඳහා වන රියදුරු බලපත්‍රයක් සහ රියදුරු පළපුරුද්ද පැවතීම අත්‍යාවශ්‍යයි.

## ප්‍රධාන වගකීම්

- ප්‍රවාහනය සහ වාහන නඩත්තුව :
  - IRCSL සේවකයන්, අමුත්තන් හෝ භාණ්ඩ ආරක්ෂිතව සහ නියමිත වේලාවට අදාළ ගමනාන්තය වෙත ප්‍රවාහනය කිරීම තහවුරු කිරීම.
  - ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගමන් ආරම්භ කිරීමට පෙර සහ පසුව දිනපතා වාහන පරීක්ෂා කිරීම සහ කිසියම් යාන්ත්‍රික දෝෂයක් ඇත්නම් ඒ පිළිබඳව සැපයුම් සේවා කළමනාකරු වෙත වාර්තා කිරීම.
  - වාහන පිරිසිදුව තබා ගැනීම සහ අවශ්‍ය පරිදි ඉන්ධන ලබා ගැනීම සිදු කරමින්, වාහන සෑම විටම උපරිම ධාවන තත්ත්වයේ පවත්වාගෙන යාම.
- කාර්යාල පරිපාලනය සහ වාර්තා කළමනාකරණය :
  - වාර්තා කළමනාකරණ පද්ධතියට සහාය වීම.
  - නියමිත වේලාවට කාර්යාලය විවෘත කිරීම සහ වසා දැමීමේ ප්‍රධාන කාර්යය ඉටු කිරීම.
  - කාර්යාල නඩත්තු කටයුතු සහ කාර්යාලයේ පිරිසිදුකම පවත්වා ගැනීම සඳහා පරිපාලන අංශයට සහාය වීම.

## ප්‍රධාන සුදුසුකම්

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 3 ක් සහිතව විෂයයන් 6 කින් සමත් වීම,

**සහ**

- වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සහිතව රියදුරෙකු ලෙස වසර පහක (05) පළපුරුද්ද.

## සාමාන්‍ය කොන්දේසි

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට අඩු විය යුතුය (රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට මෙය අදාළ නොවේ).

තම සුදුසුකම් පැහැදිලිව සනාථ කරන අයදුම්කරුවන් පමණක් කෙටි ලැයිස්තුගත කර දැනුම් දෙනු ලැබේ.

කවර හෝ ආකාරයක අනිසි මැදිහත්වීමක් හෝ බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

## වේතනය සහ ප්‍රතිලාභ

- දළ වේතනය රු. 78,425.00 + මසකට නිල ඇඳුම් දීමනාව රු. 2,000.00 කි.
- වෙනත් ප්‍රතිලාභ :
  - වාර්ෂික කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා
  - ඉතිරි නිවාඩු වෙනුවෙන් මුදල් ලබා ගැනීමේ පහසුකම
  - බාහිර රෝගී වෛද්‍ය ගාස්තු ප්‍රතිපූර්ණය
  - විස්තීර්ණ නේවාසික රෝගී වෛද්‍ය රක්ෂණය
  - ජීවිත සහ බරපතල රෝග ආවරණය
  - මූලික වැටුප මෙන් මාස 60 කට සමාන පුද්ගලික හදිසි අනතුරු රක්ෂණ ආවරණයක්
  - වාහන සහ සහන ණය පහසුකම්
  - උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රහය
  - එක් වෘත්තීය ආයතනයක සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම

සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කරන සහතික පත්‍රවල පිටපත්, රියදුරු බලපත්‍රයේ පිටපතක් සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සහිතව සකස් කරන ලද අයදුම්පත්, 2026 ඔක්තෝබර් 25 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. කවරයේ ඉහළ වම්පස කෙළවරේ "රියදුරු සහ කාර්යාල සහායක තනතුර" ලෙස සඳහන් කළ යුතුය.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම්, කරුණාකර 011 2396184/9 අංක ඔස්සේ පරිපාලන අංශය අමතන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**11 වන මහල, නැගෙනහිර කුළුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**

**වෙබ් අඩවිය : www.ircsl.gov.lk**

Gazette.lk AMBITIONS REALIZED